**ශීර්ෂය -123 - නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත **2020** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021ජූනි 01 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 දෙසැම්බර් 14 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

-------------------------------------------------------------

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංවර්ධන වැඩසටහනෙහි ව්‍යාපෘති වල ඉතිරි වීම් සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 3.5 ඡේදය ප්‍රකාරව වෙන වෙනම හේතු දැක්වීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරිවීම් සඳහා හේතු එකිනෙක ව්‍යාපෘතියට අදාලව වෙන්ව කැඳවා සාරාංශ කරගන්නා ලද කරුණු ඉතිරිවීම් වලට හේතු වශයෙන් පෙන්වන ලදී. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

### 1.6.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය - සීමා ඉක්මවීම්

-----------------------------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 සඳහා රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමේ උපරිම වියදම් සීමාව රු.7,100,000 ක් වුවද වියදම රු.36,364,359 ක් වුයෙන් උපරිම වියදම් සීමාව ඉක්මවා රු.29,264,359 ක් වැයකර තිබුණි. | එකඟ වෙමි. 2020 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමේ උපරිම වියදම් සීමාව සංශෝධනය සඳහා මුදල් අමාත්‍යාංශයේ අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර ඇති අතර අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් මෙම සීමා සංශෝධනය සඳහා යොමු කර ඇති බව දන්වන ලදී. | අත්තිකාරම් ගිණුම් සීමා තුල කටයුතු කල යුතුය. |

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **තොග පොත**<br>මුදල් රෙගුලාසි 751 හා 763 ප්‍රකාරව කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය මගින් භාණ්ඩ ලේඛන පොත් පවත්වා නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මුදල් රෙගුලාසි 751 හා 763 ප්‍රකාරව භාණ්ඩ ලේඛන පොත් පවත්වා ගත යුතුය. |
| (ආ) | **බැරකම් පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛන නිතිපතා පරීක්ෂා කල හැකි වන පරිදි සියලු බැරකම් සටහන් කර බැරකම් ලේඛනයක් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | පරීක්ෂා කර බිල් අප්‍රමාදව බේරුම් කිරීමට කටයුතු කල යුතුය. |

**1.6.4 විගණන සාක්ෂි නොවීම**

---------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියේ අත්හිටවූ කොන්ත්‍රාත්තුවකට අදාල අත්තිකාරම් සුරක්ෂණය හා කාර්යසාධන බැඳුම්කරය අයකර ගැනීම හේතුවෙන් ව්‍යාපෘතියට ලැබුණු රු. මිලියන 278.82 ක් ඉකුත් වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශය මගින් මහා භාණ්ඩාගාරය වෙත යැවූ බව සඳහන් වුවද ඒ පිළිබඳ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අමාත්‍යාංශයෙන් තහවුරු කිරීමේ ලිපිය ඉදිරිපත් කරන්නෙමු. | සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1 වියදම් කළමනාකරණය**

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුනරාවර්ථන වැය විෂයයන් 07ක එකතුව රු.1,944,000 ක ප්‍රතිපාදන සහ ප්‍රාග්ධන වැය විෂයයන් 7 ක එකතුව රු.1,375,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | එකඟ වෙමි. කොවිඩ් වසංගත තත්වය හමුවේ කාර්යාල කටයුතු සීමා කිරීම සහ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම යන කරුණු නිසා මෙම වැය විෂයයන් වල ප්‍රතිපාදන 100% ක් ඉතිරිවී ඇත. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු තාත්විකව පිලියෙල කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) කොළඹ නගරයේ නාගරික පුනර්ජනනීය වැඩසටහන (123-02-07-29-2506-12) සඳහා 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරිය රු.මිලියන 985 වී තිබියදී 2020 දෙසැම්බර් 17 දින බල අංක 46 න් මෙම වැය විෂය සඳහා රු.මිලියන 580 ක මුදලක් පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් වෙන් කර ගෙන තිබුණු අතර එම මුළු පරිපූරක ඇස්තමේන්තු මුදලම ඉතිරි වී තිබුණි. | නිරීක්ෂණ සමග එකගවේ. | පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් වෙන් කර ගත් ප්‍රතිපාදන වර්ෂය තුල ප්‍රස්තුත කාර්යය සඳහා යෙදවිය යුතුය. |
| (ඇ) නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය වීමේ ව්‍යාපෘතිය සඳහා 2019 ජුලි 22 දින ගිවිසුම් ගතවූ ඇමරිකානු ඩොලර් මිලියන 200 කට සමාන රු. මිලියන 35,163.7 ක් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව මගින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. මුළු ණය මුදලින් 2019 හා 2020 වර්ෂයන්හී දෙසැම්බර් 31 දිනට ඉතිරිවූ නොගත් ණය මුදල වන පිළිවෙලින් ඇමරිකානු ඩොලර් 36,338,959 ක් හා ඇමරිකානු ඩොලර් 91,663,933 කින් ගිවිසුමට අනුව කැපවීමේ ගාස්තුව (**Commitment fee)** ලෙස පිළිවෙලින් ඇමරිකානු ඩොලර් 196,863 ක් හා ඇමරිකානු ඩොලර් 496,581 ක් ලෙස එකතුව ඇමරිකානු ඩොලර් 693,444 ක් හෙවත් රු.128,002,892 ක් අයකර ගෙන තිබුණි. | 2020 වර්ෂයේ සියලුම වියදම් front end fee and Commitment Charges යන සංරචකය ඔස්සේ ගිණුම්ගත කර ඇත. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් සපහා ඇති තොරතුරු මත පදනම් වටිනාකම් වාර්තා කර ඇත. | රජයට වාසිදායක වන ලෙස ගිවිසුම්ගතව සැලසුමට අනුව කාලවකවානු තුල කාර්යක්ෂමව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර මෙම නිෂ්කාර්යා වියදම් අවම කිරීමට කටයුතු කලයුතුය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ.94(1) ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොබැදිය යුතු වුවත් වැයවිෂයයන් දෙකකට අදාලව ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා රු.20,221,653 ක බැරකම්වලට බැදීම් ඇති කරගෙන තිබුණි. | සංවර්ධන ව්‍යාපෘති දෙකක ව්‍යාපෘති කාර්යාලවලට ගෙවිය යුතු විදුලිය, ජලය, කාර්යාල කුලී හා ගෙවිය යුතු උපදේශන සේවා වලට අදාල බිල්පත් නිසා මෙම බැරකම නිර්මාණය වී ඇත. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොබැදිය යුතුය. |

**2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි අංක 103 හා 104 | කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පවතින RTC උප ව්‍යාපෘතිය වෙත නිකුත් කර තිබුණු රු.360,000 ක් වටිනා සෝලා පැනල් 03 ක ඌනතාවයක් 2019 වර්ෂයේ තොග පරීක්ෂාවේදී නිරීක්ෂණය වී තිබුණු අතර 2020 වර්ෂයේදී කාර්යාල පුටු 01 ක් සහ CMC හි | පිළිතුරු ලබාදී නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්‍ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කර ක්‍රියාමාර්ග ගැනීම සහ ප්‍රාරම්භක වාර්තා සහ පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| | ලැප්ටොප් පරිගණක 01 ක ඌනතාවයක් තිබුණි. නමුත් මෙම අලාභහානි සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට සහ ප්‍රාරම්භක වාර්තා සහ අවසන් වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | | |
| (ii) මුදල් රෙගුලාසි අංක 763 (ආ) (ii) | භාණ්ඩ පමණට වැඩියෙන් තොගයේ තබාගැනීම ගොඩගැසීම හා විනාශයට පත්වීම වැලැක්වීමට පියවර ගතයුතු වුවද කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ස්ථාන 04 ක භාණ්ඩ 178 ක් ගොඩගැසීම හා විනාශයට පත්වීමට ඉඩ හැර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මුදල් රෙගුලාසි අංක 762 ප්‍රකාරව ක්‍රියාකල යුතු වේ. |
| (iii) මුදල් රෙගුලාසි අංක 757 සහ 760 | සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් පෙන්වා දී ඇති විෂමතා, ඌනතා සහ නැතිවීම් කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් සමීක්ෂණය ඇරඹි දින සිට තෙමසක් ඇතුළත පරීක්ෂණයන් කළ යුතු වුවද කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ සහ අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ 2019 සහ 2020 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණවලදි අයිතම 32 කට අයත් භාණ්ඩ 109 ක ඌනතාවයන් හදුනාගෙන තිබුණු අතර එම ඌනතාවයන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | covid 19 වසංගතය හේතුවෙන් රට අගුලු දැමීම හේතුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රමාද විය. | භාණ්ඩසමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් පෙන්වා දී ඇති විෂමතා, ඌනතා සහ නැතිවීම් සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති වැඩබිම් 06 ක වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා එම වාර්තා විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත | චක්‍රලේඛය පරිදි සමීක්ෂණ පවත්වා එම වාර්තා විගණනයට ඉදිරිපත් කලයුතුය. |
| (ඇ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2 ඡේදය | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ සහ කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ 2019 සහ 2020 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා මගින් හදුනාගත් ප්‍රයෝජනයට ගත නොහැකි අයිතම 29 කට අයත් භාණ්ඩ 139 ක් සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව කමිටුව විසින් නිර්දේශයන් ඉදිරිපත්කර තිබුණද ඒ අනුව ක්‍රියාකර අවසන් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | **covid** 19 වසංගතය හේතුවෙන් රට අගුලු දැමීම හේතුවෙන් අවභාග ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රමාද විය. | ලබාදී ඇති නිර්දේශ අනුව ක්‍රියාකර අවසන් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>(i) 7.9.11. ඡේදය | ඉංජිනේරු ඇස්තමේන්තුව හා ලංසුවෙහි ප්‍රමාණපත්‍ර රේට අතර වෙනස ඉඩ දිය හැකි ආන්තිකයට වඩා වෙනසක් වේ නම්, එම වෙනසට අදාළ අයිතම පිළිබද තාකෂණික ඇගයීම් කමිටුව සෑහීමට පත්වන පරිදි එම කාර්යය සඳහා අනුප්‍රමාණ විශ්ලේෂණයක් ලංසුකරුගෙන් ලබාගෙන ඇගයීම කලයුතු විය. එහෙත් ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 213.62 ක් වටිනා **Srimahabodi Car Park and Erection of Interpretation Board Anuradapura** යන කොන්ත්‍රාත්තුවේ ඉදිරිපත් කල ලංසුව හා ඉංජිනේරු ඇස්තමේන්තුවේ ප්‍රමාණ | නිරීක්ෂණය සමග එකඟවේ. | කොන්ත්‍රාත්තුව කට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තුව හා ලංසුවෙහි ප්‍රමාණ අයිතමය අතර වෙනස ඉඩ දිය හැකි ආන්තිකයට වඩා වෙනසක් වේ නම්, එම වෙනසට අදාළවන අයිතම පිළිබද රේට විශ්ලේෂණයක් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අයිතම වල ආන්තිකය සියයට 15 ත් සියයට 216 ත් අතර එනම් රු.මිලියන 40 ක පමණ විචලනයක්ද සිදුව තිබියදි හා ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 140.54 ක් වූ **Lion pillour Round board , Railway Plaza** කොන්ත්‍රාත්තුවේ ප්‍රමාණ අයිතම වල ආන්තිකය සියයට 13 ත් සියයට 90 ත් අතර විචලනයක් සිදුව තිබියදිත් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මාර්ගෝපදේශය අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (ii) | 5.4.12 ඡේදය | වැට් බදු ආවරණය කිරීම සඳහා මුදල් ගෙවීමෙන් ඊළග මාසයේ 15 දිනට පෙර එම ගෙවීම් පිළිබද විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශිය අදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු විය. එහෙත් උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය විසින් ඉදිකිරීම්, භාණ්ඩ, උපදේශන කොන්ත්‍රාත් හා මිලදී ගැනීම් සඳහා ගෙවන ලද රු. මිලියන 359.64 ක වැට් බදු සම්බන්ධයෙන් සහ අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය විසින් අවස්ථා 21 කදී ගෙවන ලද රු. 5,305,833 ක වැට් බදු සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමග එකඟවේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව කටයුතු කළ යුතුය. |

**(ඉ) නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහායවීමේ ව්‍යාපෘතියේ ණය ගිවිසුම**

| | | | | |
|---|---|---|---|---|
| (i) | 2019 අප්‍රේල් 24 දිනැති ණය ගිවිසුමේ පොදු කොන්දේසියේ 4.09 වගන්තිය | නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහායවීමේ ව්‍යාපෘතියේ මූල්‍ය කළමනාකරණ පද්ධතිය අමාත්‍යාංශය සහ නාගරික සංවර්ධන අධිකාරිය හරහා නඩත්තු කළ යුතු වුවත්, සමාලෝචනය කරන ලද වර්ෂය අවසානය දක්වාම එවැනි ක්‍රමයක් හඳුන්වා දී නොතිබුණි. | කොවිඩ් - 19 තත්ත්වය හේතුවෙන් එය ප්‍රමාද විය. | ව්‍යාපෘතියේ මූල්‍ය කළමනාකරණ පද්ධතිය අමාත්‍යාංශය සහ නාගරික සංවර්ධන අධිකාරිය හරහා නඩත්තු කළ යුතුය. |
| (ii) | ණය ගිවිසුමේ 2 වන උපලේඛනයේ (පාරිසරික හා සමාජ අවශ්‍යතා) | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර පාරසරික හා සමාජ කළමනාකරණ සැලසුම් කිරිමේ රාමුව සහ නැවත පදිංචි කිරිමේ ප්‍රතිපත්ති රාමුව සකස් කල යුතු වුවත් නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහායවීමේ ව්‍යාපෘතිය මඟින් එවැනි ප්රතිපත්ති සකස් කර නොතිබුණි. | ඔබේසේකරපුර මාදම්පිටිය ඉඩම් සඳහා නැවත පදිංචි කිරිමේ සැලසුම් දෙකක් සකස් කර අනුමැතිය ලබාගෙන ඇත. | ණය ගිවිසුමට අනුකූලව ප්‍රතිපත්ති රාමු සකස් කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 සැලැසුම් කිරීම

-----------------

| විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

(අ) උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| **(i)** | ව්‍යාපෘතියේ සහ නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතියේ සමස්ත ව්‍යාපෘති කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි මූල්‍ය හා භෞතික ඉලක්ක ඉස්මතුකර දක්වමින් නිශ්චිත ඉලක්ක සපුරා ගැනීම සඳහා පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතු වුවත් එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් සහ වසර මැදදී වැඩසටහන අවලංගු කිරීම හේතුවෙන් මෙය සිදු කර නොතිබුණි. | විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කලයුතුය**.** |

| | | |
|---|---|---|
| **(ii)** ව්‍යාපෘතියේ උපදේශන සේවා සමාගම් විසින් කාල ප්‍රමාදයකින් පසුව සැලසුම් ඉදිරිපත් කිරීම සහ එම සැලසුම් මත ප්‍රසම්පාදන කටයුතු කාලීනව සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන් යාපනය නගරය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ රු. මිලියන 3,380.70 (ඇ.ඩො.මි. 19.66 ක) ක් වටිනා උප ව්‍යාපෘති 09 ක කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විට අත්හිටුවා තිබීම හේතුවෙන් ඒ තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. | නිරීක්ෂණ සමග එකග වේ. | අදාල ගිවිසුම් ප්‍රකාරව සමාගමෙන් ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කල යුතුය. |
| **(iii)** ව්‍යාපෘතිය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන විශේෂ ඩොලර් ගිණුමේ 2020 ජනවාරි 01 දිනට රු.මිලියන 797.85 කට සමාන එජඩො මිලියන 4.39ක ශේෂයක් පැවතුණි. ඊට අමතරව රු.මිලියන 2,544.13 කට සමාන එජඩො මිලියන 13.80 ක් සමාලෝචිත වර්ෂය තුළ ලබාගෙන තිබුණි. නමුත් ව්‍යාපෘතියේ දුර්වල මූල්‍ය පුරෝකථනය හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 732.60 කට සමාන එජඩො මිලියන 3.93 ක් විශේෂ ඩොලර් ගිණුමේ අතිරික්තව පැවතුණි. | විදේශීය අරමුදල් සහිත ව්‍යාපෘති වලදී කාර්තුමය පදනම සඳහා මුදල් ලබා ගැනීම සඳහා **IUFR** ඉදිරිපත් කරනු ලැබේ. සැකසුම් කාලය සමඟ මෙම කාලය මාස 4 සිට 4.5 දක්වා වැඩි විය හැක. ඒ නිසා, ඩොලර් ගිණුමේ මාස 3 සිට 4 දක්වා මුදල් තිබෙනු ඇත. | විදේශ ව්‍යාපෘතිවල මූල්‍ය පුරෝකථනය නිවැරදිව සිදුකර ඉහල මූල්‍ය හා භෞතික කාර්යසාධනයක් ලබාගැනීමට කටයුතු කල යුතුය. |
| **(ආ)** නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහායවීමේ ව්‍යාපෘතිය | | |
| **(i)** ව්‍යාපෘතියේ ස්ටේඩියම්ගම, ඔබේසේකරපුර සහ ඇපල්වත්ත ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර, පරිසර උපදේශක කමිටුවේ අනුමැතිය හා ගුවන්,ගිනි, ජල විදුලිය සහ ජලා පවාහන මාර්ග සඳහා අනුමැතිය ලබානොගෙන, ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා අත්තිකාරම් වශයෙන් 2021 අප්‍රේල් 06 දින රු.මිලියන 984 ක් අදාල කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබුණි. | 2021 ජුනි 15 වන විට ස්ටේඩියම්ගම සහ ඔබේසේකරපුර ව්‍යාපෘති මඟින් පරිසර උපදේශක කමිටු වාර්තාව සම්පූර්ණ කර නාගරික සංවර්ධන අධිකාරියට ඉදිරිපත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.1 ට අනුව ව්‍යාපෘති නියමිත කාලය තුල අවසන් කිරීමට පූර්ව ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස සැලසුම් කල යුතුය. |
| **(ii)** ව්‍යාපෘතියේ නැවත සංවර්ධනය කිරීමේ සමස්ථ ව්‍යාපෘති සැලැස්මට අනුව ඉඩම් කට්ටි 04(අක්කර 37.5 ) ක් 2020 වර්ෂය තුලදී සංවර්ධනය කිරීමට නියමිතව තිබුණද 2021 මැයි මස අවසාන වන විටත් එම ඉඩම් සංවර්ධනය කර නැවත පදිංචි කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි. | තෝරාගත් ඉඩම් 10 න් 3 ක් සංවර්ධනය කිරීම සඳහා දැනට ප්‍රසම්පාදන කටයතු සිදුවෙමින් පවතී. සංවර්ධනය සඳහා යොමු කොන්දේසි සකස් කර AIIB වෙත ඉදිරිපත්කර ඇත. යෝජනා ඉදිරිපත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.1ට අනුව ව්‍යාපෘති නියමිත කාලය තුල අවසන් කිරීමට පූර්ව ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස සැලසුම්කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය විසින් සමස්ථ ව්‍යාපෘති කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි අපේක්ෂිත ඉලක්ක ඇතුළත් සමස්ථ ක්‍රියාකාරී සැලැස්මක් හා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ව්‍යාපෘති විස්තර සැලසුම් කිරීම සඳහා වන උපදේශනය ප්‍රමාද වී ඇති බැවින්, 2020 වසර අවසන් වන විට ප්‍රවේශ ව්‍යාපෘති කාලසීමාව ආවරණය වන පරිදි විස්තීරණ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම ව්‍යාපෘතියට සම්පූර්ණ කළ හැකි නොවේ. කෙසේ වෙතත් එය සකස් කර නැත. | අපේක්ෂිත ඉලක්ක ඇතුළත් සමස්ථ ක්‍රියාකාරී සැලැස්මක් හා අයවැය ලේඛනයක් පිළියෙල කල යුතුය. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය | | |
| (i) | ව්‍යාපෘතියේ ජල ගැලීම් පාලනය සඳහා වර්ෂය තුල ගාල්ල නගර සංවර්ධනය යටතේ කළ යුතු කාණු පද්ධති 16 ක වැඩ ආරම්භ කර නොතිබුණු අතර එයට අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනිමටද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. මෙම තත්ත්වය නිසා ව්‍යාපෘතියේ අරමුණු ගත කාර්යය ඉටු කර ගැනීමට නොහැකි වන බව නිරීකෂණය විය. | ගාල්ල ප්‍රදේශයේ ජලය රැඳවුම් ප්‍රදේශ 8ක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සිදුවෙමින් පවතී. හඳුනාගත් ඉඩම් අත්පත් කර ගැනීමේ හරස් ඇළ 6ක් ආරම්භ කර ඇත. | ව්‍යාපෘතිවල කාර්යයන් සැලසුම්කල පරිදි සිදුකර අපේක්ෂිත ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කල යුතුය. |
| (ii) | ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය තුළ වැඩ අවසන් කිරිමට සැලසුම්කර තිබූ ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 3,198.56 ක් වූ ව්‍යාපෘති 10 ක භෞතික කාර්ය සාධනය සියයට 50 ට වඩා අඩු අගයක් ගෙන තිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ අවසන් කළ යුතු ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 16.08 ක් වූ එක් ව්‍යාපෘතියක කිසිදු භෞතික කාර්ය සාධනයක් ලඟාකර ගෙන නොතිබුණි. | දුවශීලතා ගැටළු ඇති කොන්ත්‍රාත්කරුවන් 04 දෙනෙක් සිටි අතර ප්‍රධාන වශයෙන් 2020 දී රට තුළ පැවති කෝවිඩ් වසංගතය සහ අගුලු දැමීමේ තත්ත්වය හේතුවෙන් අනෙකුත් කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්ය සාධනය අඩු විය. | -එම- |

| | | | |
|---|---|---|---|
| (iii) | ව්‍යාපෘතියේ උපදේශන ආයතනයක ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් මගින් ගාල්ල නගරයේ ජල ගැලීම් පාලනය සඳහා මොරගොඩ ඇළ දෙපස ජල රැඳවුම් ප්‍රදේශ 10 ක් ස්ථාපිත කිරීමට හඳුනාගෙන තිබුණද එම ජල රැඳවුම් ප්‍රදේශවලට අයත් ඉඩම් කොටස් අත්කර ගැනීමේ කටයුතු ඉකුත් වර්ෂය අවසාන වන විට අත් හිටුවා තිබුණි. මේ සඳහා තෙත් බිම් කළමනාකරණ සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි. | ජල රැඳවුම් ප්‍රදේශ සඳහා යෝජිත සියලුම ඉඩම් පුද්ගලික අයිතියට අයත් ඉඩම් බැවින් ඒවා අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ නොකර තෙත්බිම් ලෙස කළමනාකරණය කිරීමට රජයට බලයක් නොමැති අතර **PMU, SCDP** තෙත්බිම් කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලිය නවතා ඇත. | ශක්‍යතා අධ්‍යයන වාර්තා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | | |
| **(i)** | ඇස්තමේන්තු ගත පිරිවැය රු. මිලියන 877 ක් වූ අනුරාධපුර පොල ගොඩනැගිල්ල සහ බහු මහල් රථගාල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව, අනුරාධපුර නගරයේ පවතින කාර්ය බහුලත්වය හා ඉදිකිරීම් කර ගෙන යාමේදී අගතියට පත්වන පාර්ශවයන්ට වන්දි ගෙවීමට සිදු වීම වැනි කරුණු මත නතර කර තිබුණි. මේ අනුව ව්‍යාපෘතිය නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ඉටු කළ ව්‍යාපෘතියක් බව නිරීක්ෂණය විය. | පොළ සහ බහු මහල් රථගාල් සංවර්ධනය සමඟ ශක්‍යතා අධ්‍යයනය සහ ආයෝජන සැලැස්ම අරමුදල් නියෝජිතයා විසින් අනුමත කර ඇති අතර සාමාන්‍ය ජනතාවට සිදුවිය හැකි අපහසුතාවයන් පාරිසරික කළමනාකරණ සැලැස්ම මගින් කළමනාකරණය කළ හැකිය. අරමුදල් නියෝජිතයාගේ/ **AFD** හි සැලකිලිමත් වීම හේතුවෙන් උප ව්‍යාපෘතිය අත්හැර දමන ලදී. | ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර සක්‍යතා අධ්‍යයනයක් කර පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් කිරීමට කටයුතු කල යුතුය. |
| **(ii)** | ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවාව ලබා ගැනීම වෙනුවෙන් රු.මිලියන 212.66 ක් (යුරෝ මිලියන 1.18) සඳහා 2017 අගෝස්තු 29 වන දින උපදේශන ආයතනයක් සමග ගිවිසුමකට එළඹ තිබු නමුත් 2018 ඔක්තෝබර් 12 දින වන විට ලබාදිය යුතුව තිබු උපදේශන සේවා අවසාන වාර්තාව 2020 දෙසැම්බර් 31 වන විටත් ලබා දී නොතිබුණු අතර උපදේශන කොන්ත්‍රාත් කාලය 2019 දෙසැම්බර් 31 දිනෙන් පසු දීර්ඝ කර නොතිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයට අදාලව රු. මිලියන 42.11 ද ඇතුලුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට උපදේශන සමාගමට රු. මිලියන 100.32 ක් ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි. උපදේශක සේවා ගිවිසුමෙහි 46.2 වගන්තිය අනුව උපදේශන වාර්තා 03 ක් ලබාදීමේ | කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද උපදේශන ප්‍රසම්පාදන කමිටුව (**CACPC**) විසින් 2021 මාර්තු 31 දක්වා කාලය දීර්ඝ කිරීම අනුමත කරන ලදී. ඇගයීම අවසන් වූ පසු**,** ද්‍රවශීලතා හානි සලකා බැලිය හැකිය. කොන්ත්‍රාත්තුවේ නියමයන් සහ කොන්දේසි සම්පූර්ණ කර ඇති බෙදාහැරීම් සඳහා ගෙවීම් සිදු කර ඇත. | ගිවිසුම ප්‍රකාරව අයකරගත හැකි උපරිම කාල පමා ගාස්තු අයකර ගැනීමට එම අවස්ථාවේම කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පමාකාලය වර්ෂයකට වඩා වැඩි වීම මත ගිවිසුම ප්‍රකාරව අයකරගත හැකි උපරිම කාල පමා ගාස්තු සීමාව වන රු. මිලියන 21.26 ක් අයකර ගැනීමටද ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි. | | |
| **(iii)** | ඉහත පරිදි නියමිත දිනට වාර්තා ලබා නොදී තිබියදී **2019** වර්ෂයේදී එම ව්‍යාපෘතියේ අපජල කළමනාකරණ උපදේශන සේවාව ලබා ගැනීම වෙනුවෙන් ද රු.මිලියන **18.62** ක (යුරෝ මිලියන **0.11)** වටිනාකමකට එම උපදේශන සමාගම සමඟ නැවත ගිවිසුමකට එළඹ තිබුණි. | අප ජල කළමනාකරණ සඳහා ශක්‍යතා අධ්‍යයනය (මුල් කොන්ත්‍රාත්තුවට එකතු කිරීම) **2020** අවසන් වන විට අවසන් කර ඇති අතර විස්තර සැලසුම්වලට අදාළ සියලුම බෙදාහැරීම් **2021** මාර්තු අවසානය වන විට ඉදිරිපත් කරන නමුත් සමහර බෙදා හැරීම් සම්පූර්ණ කර නොමැත. එබැවින්**, 2021** මැයි මාසයේදී ලේකම් විසින් වෙනත් ප්‍රසම්පාදන කමිටුවක් පත් කර ඇත. **EOT** ඇගයීම සිදු වෙමින් පවතී**.** | උපදේශන සේවා ලබා ගැනිමේහි පූර්ව සේවා පිළිබඳව විධිමත්ව සොයා බැලිය යුතු වීම. |
| (ඇ) | කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | | |
| | ගංවතුර පාලන හා ජල කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා වූ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2021 මැයි 05 දින වන විටත් අවසන් නොවීම හේතුවෙන් ව්‍යාපෘති කාලය නිමාවීමට පෙර ආර්සීටී පද්ධතිය නියමිත ස්ථානයේ ස්ථාපිත කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොතිබුණි. | ව්‍යාපෘතිවල කාර්යයන් සැලසුම්කල පරිදි සිදුකර අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහායවීමේ ව්‍යාපෘතිය | | |
| **(i)** | ව්‍යාපෘතියේ ඇපල්වත්ත නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතියේ නිවාස ඒකක 700 ක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන ආරම්භක අත්තිකාරම් වශයෙන් රු.මි.155.6ක් 2021 ජනවාරි 26 දින ගෙවා තිබුණද ව්‍යාපෘතිය සඳහා උපදේශකයින් තෝරාගෙන නොතිබීම නිසා උපදේශකයින්ගේ අධික්ෂණයකින් තොරව ව්‍යාපෘතියේ ආරම්භක කාර්යයන් සිදුකර තිබුණි. | ව්‍යාපෘතිය නිම කිරිමේ කාලසීමාවට එය බලපෑ හැකිය. මෙම ප්‍රමාදය කොවිඩ් - 19 හේතුවෙනි. | ඉදිකිරීම් ව්‍යාපෘතීන් ප්‍රමිතීන් අනුව සිදුකරන බවට උපදේශකයින්ගේ අධීක්ෂණය යටතේ සිදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | ව්‍යාපෘතියේ ක්‍රියාකාරි සැලැස්මට අනුව 2020 දෙසැම්බර් 31 දිනට පෙර මාදම්පිටිය නිවාස ව්‍යාපෘතියේ නිවාස ඒකක 700 ක් ඉදිකිරිම සඳහා කොන්ත්‍රාත්කරුවන් සහ උපදේශන ආයතන තෝරාගෙන තිබියයුතු වුවද 2021 අප්‍රේල් 8 දින දක්වාම එම ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරුවන් හා උපදේශන ආයතන තෝරාගෙන නොතිබුණි. | 2021 මාර්තු 16 දින විශේෂඥ සේවා සඳහා වූ ආයතනයකට පිරිනමන ලදී. ව්‍යාපෘතියට සම්බන්ධ ගෘහ නිර්මාණ ශිල්පීන් සහ ඉංජිනේරුවන් විසින් මූලික කටයුතු සිදුකරන ලදී. | ක්‍රියාකාරි සැලැස්මට අනුව කටයුතු කල යුතුය. |

## 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන **10,025** කට සමාන යුරෝ මිලියන 62.4 ක් වන අතර ඉන් රු. මිලියන **8,354** කට සමාන යුරෝ මිලියන 52 ක් සැපයීමට ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කර 2021 දෙසැම්බර් 31 දින නිමකිරිමට අපේක්ෂා කර තිබුණි. නමුත් වර්ෂ **4** ක් ඉකුත් වූ පසු එනම් 20**20** දෙසැම්බර් 31 දිනට මුළු වෙන් කිරීමෙන් සියයට 3 ක් නියෝජනය වන රු. මිලියන **308.84** කට සමාන යුරෝ මිලියන **1.84** ක් පමණක් උපයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා රජයේ අයවැය ඇස්තමේන්තුව මගින් වෙන්කරන ලද රු.මිලියන 228 කින් සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 125.54 ක් උපයෝජනය කර තිබුණි. | නිරීක්ෂණ සමග එකඟ වේ. ව්‍යාපෘතිය 2020 මූල්‍ය වර්ෂය අවසන් වන විට AFD වෙතින් ලබාගත් මූලික අත්තිකාරමෙන් (රු. 204.25) 87%ක් භාවිතා කර ඇති අතර 2021 මැයි වන විට, 2 වැනි පුනර්ජනනීය අත්තිකාරම් ලබා දී ඇත. අයවැය ප්‍රතිපාදනවල අපේක්ෂිත ඉතිරිකිරීම් හඳුනාගෙන රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති **SCDP** වෙත රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව මාරු කර ඇත. | උපදේශන සේවා අවසාන වාර්තාව කඩිනමින් ලබාගෙන ව්‍යාපෘති කටයුතු කඩිනම් කල යුතුය. |
| (ආ) | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ දෙවන උපව්‍යාපෘතියේ කටයුතු 2021 වර්ෂය අවසාන වන විට අවසන් විය යුතු වුවද හඳුනාගත් රු. මිලියන 6,883.25 ක් වටිනා කුඩා ව්‍යාපෘති 10 ක ප්‍රසම්පාදන කටයුතු 2021 මැයි වන විටත් අවසන්ව නොතිබුණු අතර ඉඩම් පවරා ගැනීම සහ වන්දි ගෙවීම් කටයුතු 2021 දෙසැම්බර් වන තෙක්ම ප්‍රමාද වන බවද නිරීක්ෂණය විය. | 2020 දෙසැම්බර් 31 වන විට කොන්ත්‍රාත් පැකේජ දෙකක් ලබා දී ඇත. එක් වැඩ පැකේජයක ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත. 2021 ජූනි වන විට ව්‍යාපෘතිය මගින් | ව්‍යාපෘති කටයුතු කාලීනව සැලසුම් කල පරිදි ඉටුකර ගැනීම සඳහා පියවර ගත යුතුය. |

රුපියල් 947.18 ක වටිනාකමකින් යුත් පැකේජ 4 ක් ප්‍රදානය කර ඇති අතර තවත් පැකේජ 2 ක් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත. ඉතිරි පැකේජ ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීමේ කටයුතු ඇතුළුව ටෙන්ඩර් පූර්ව අදියර යටතේ පවතී. Covid 19 වසංගතය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අහිතකර ලෙස බලපා ඇති බව කරුණාවෙන් සලකන්න.

## 3.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු ඵලදායිව කළමනාකරණය නොකිරීම හේතුවෙන් රුපියල් මිලියන 3,616.18 ක (ඇ.ඩො.මිලියන 20.19) ප්‍රදානය කරන ලද උප කොන්ත්‍රාත් 05 ක කටයුතු අතරමගදී අත්හිටුවා තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වීමට නියමිත වන බැවින් එදිනට ඉදිකිරීම් වැඩ අවසන් කළ නොහැකි කොන්ත්‍රාත් 8 ක ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 360.64 කින් අඩු කර එහි විෂයපථය සංශෝධනය කිරීම හේතුවෙන් ඒ තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ ලඟා කර ගැනීමට නොහැකි වී තිබුණි. | නිරීක්ෂණ සමග එකඟවේ. කොන්ත්‍රාත්කරුගේ ද්‍රවශීලතා ගැටලුව හේතුවෙන් මහනුවර ප්‍රධාන මාර්ග ව්‍යාපෘති දෙක ප්‍රදානය කිරීම අවලංගු කිරීමට සිදු වූ අතර සැලසුම් ගැටලු සහ ඉඩම් අත්පත් කර ගැනීම් ගැටලු හේතුවෙන් මැද ඇළ 1 සහ 2 ව්‍යාපෘති සීමා කිරීමට සිදු විය. ගාල්ලේ මොරගොඩ ඇළ ක්‍රියාකාරීත්වය දුර්වල වීම හේතුවෙන් අවලංගු කිරීමට සිදුව තිබේ. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකල හැකි පරිදි ව්‍යාපෘති ඵලදායිව කළමනාකරණය කිරීම කල යුතුය. |
| (ආ) කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය සඳහා, ණය දීමේ ඒජන්සිය මගින් ලබා දීමට නියමිත ඇ.ඩො. මිලියන 213 ට සමාන රු.මිලියන 27,890.22 ක මුළු මුදලෙන් සියයට 32 ක් නියෝජනය කරන ඇ.ඩො. මිලියන 68.4 ක් එනම් රුපියල් මිලියන 10,513.4 ක් සහ රජයේ ප්‍රතිපාදන | අදහස් දක්වා නැත. | ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදිත මුදල් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |

යටතේ ප්‍රතිපාදිත ඇ.ඩො. මිලියන 108 කට සමාන රුපියල් මිලියන 14,141.52 ක් වූ මුළු ප්‍රතිපාදන වලින් සියයට 60.8 ක් නියෝජනය කරන ඩොලර් මිලියන 65.7 කට සමාන රුපියල් මිලියන 10,105.06 ක් 2020 දෙසැම්බර් 31 දින වන විට භාවිතා කර තිබුණි. ඉතිරි මුදල 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ව්‍යාපෘති කාලය තුළදී උපයෝගී කර ගැනීමේ හැකියාව සැක සහිත බව නිරීක්ෂණය විය.

## 3.5 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය | | |
| ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 152.47 ක්වූ යාපනයේ පැරණි කච්චේරි ගොඩනැඟිලි භූමිය සංරක්ෂණය සඳහා සැලසුම් සහ ඉදිකිරීම් අධීක්ෂණ උපදේශන සේවාව සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. මිලියන 8.42 ක් ගෙවා තිබුණද නියමිත කාලරාමුව තුළ සැළසුම් ලබා නොදීම හේතුවෙන් ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 485 ක්වූ පැරණි කච්චේරි ගොඩනැගිල්ල ඉදිකිරීම ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. | ප්‍රමාදයන් සහ පිළිගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයන්, විශේෂයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තු නිෂ්කාශන ලබා ගැනීමේ ප්‍රමාදයන් යන දෙකම හේතුවෙන් උපදේශනකරුට භාරදීම කාලසටහනක් ලෙස ඉදිරිපත් කිරීමට නොහැකි විය. එබැවින් පැරණි කච්චේරි ගොඩනැගිල්ලේ සැලසුම අඩු කිරීම සඳහා උපදේශක කොන්ත්‍රාත්තුවේ විෂය පථය සංශෝධනය කර ඇත. | උපදේශන ආයතනයෙන් ප්‍රමාද ගාස්තු අයකරගැනීමට සහ ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට පියවර ගතයුතුය. |
| (ආ) **UPPF** ව්‍යාපෘතිය - කුරුණෑගල, දඹුල්ල, ත්‍රිකුණාමලය හා රත්නපුර නගරවල ව්‍යාපෘති හඳුනා ගැනීම පිණිස ආරම්භ කර තිබුණු ව්‍යාපෘතිය | | |
| **(i)** මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මිලියන 1,090.98 කට සමාන එ.ජ.ඩො. මිලියන 5.74 ක් වන අතර ඉන් රු. මිලියන 883.88 කට සමාන එ.ජ.ඩො මිලියන 4.65 ක ණය ලබාදීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි | භාණ්ඩාගාරය විසින් ව්‍යාපෘතිය අවලංගු කිරීමත් සමඟ කොවිඩ් වසංගතය සහ රට තුළ අගුලු දැමීම හේතුවෙන් 2020 සැලැස්ම සාක්ෂාත් කර ගත නොහැකි විය. | ගිවිස ගත් ණය කාලසීමාව තුල නිවැරදිව සැලසුම්කල කාර්යන් නිමකර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට හා රජයට පාඩුවක් නොවන පරිදි කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| කටයුතු 2019 මාර්තු 06 දින ආරම්භ කරන ලද අතර 2021 මාර්තු 31 වන විට නිමකිරිමට අපේක්ෂා කර තිබුණි. එම ආසියානු සංවර්ධන බැංකුව මගින් වෙන්කරන ලද අරමුදල්වලින්, 2020 දෙසැම්බර් 31 දිනට සියයට 29 ක් නියෝජනය වන රු.මිලියන 255.40 කට සමාන එජඩො මිලියන 1.32 ක් ව්‍යාපෘති කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි. 2020 අගොස්තු 18 දිනැති හා අංක **ER/AB/US/**01(**vol-i)** දරන ලිපිය අනුව මෙම ව්‍යාපෘති කටයුතු අත්හිටුවීම මත එම ණය මුදල රටට වැය බරක් පමණක්ම වී ඇත. | | |
| (ii) මෙම ව්‍යාපෘතියේ උපදේශන ආයතන විසින් ගිවිසුම් ගත පරිදි සමාලෝචිත වර්ෂය තුළ ඉදිරිපත් කළ යුතු උපදේශන වාර්තා 30 ක් 2020 ඔක්තෝබර් වන විටද ලබා දීමට අපොහොසත්ව තිබුණි. මාස 01 -13 ත් ප්‍රමාද කාලය පැවතියද, ප්‍රමාද ගාස්තුවක් උපදේශන ආයතන වලින් අය කර ගැනීම සඳහා ප්‍රතිපාදනද උපදේශන සේවා ගිවිසුමෙහි අන්තර්ගත කර නොතිබුණි. උපදේශන සේවා ආයතන 3 ක් සඳහා ගෙවා තිබු රු. මිලියන 214.88 ක් ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා දරන ලද රු.මිලියන313.05 ක වියදම ව්‍යාපෘති කටයුතු අත්හිටුවීම මත නිශ්කාර්ය වියදමක් වන බව නිරික්ෂණය විය | ව්‍යාපෘතිය මඟින් දැනටමත් උපදේශක සේවා අවසන් කර ඇත. කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව ද්‍රවශීලතාවයට හානි වීම අඩු කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශන කොන්ත්රාත්තුවේ කිසිදු වගන්තියක් නොමැත. මෙය කාල පදනම් උපදේශන කොන්ත්‍රාත්තුවකි. | ගිවිස ගත් ණය කාලසීමාව තුල නිවැරදිව සැලසුම්කල කාර්යන් නිමකර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට හා රජයට පාඩුවක් නොවන පරිදි කටයුතු කල යුතුය. |

**3.6 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(**අ) උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය | | |
| **(i)** ව්‍යාපෘතිය 2014 ආරම්භ කර 2019 වර්ෂයේ අවසන් විය යුතු වුවද, ව්‍යාපෘති කාලය 2021 දෙසැම්බර් 31 ක් දක්වා තවත් වර්ෂ 02 කින් දීර්ඝ කර තිබුණි. ව්‍යාපෘතියේ සංවර්ධන | ආරම්භක අදියරේ දී සැලසුම්කරණය සහ ඉඩම් අත්පත් කර ගැනීම් යන හේතු නිසා මුල් අරමුදල සඳහා ව්‍යාපෘති කාලය 2019 සිට | සැලසුමට අනුව වැඩි ප්‍රතිලාභීන් පිරිසකට ප්‍රතිලාභ ලැබෙන පරිදි කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අරමුණු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු මත ප්‍රතිලාභ ලැබිය යුතු ජනතාව 650,000 ක් වුවද සත්‍ය වශයෙන් ප්‍රතිලාභ ලබන සංඛ්‍යාව 400,000 ක පමණ පහළ අගයක විය. | 2021 දක්වා දීර්ඝ කර ඇත. ව්‍යාපෘතියෙන් KMTT ක්‍රියාකාරකම් ඉවත් කිරීම සහ ඇමරිකානු ඩොලර් මිලියන 92.0 ක් අවලංගු කිරීම අපේක්ෂිත ප්‍රතිලාභීන් අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | |
| **(ii)** | රු. මිලියන 311 ක් වටිනා උපදේශන සේවා කොන්ත්‍රාත් 04 ක ගිවිසුම් කාලය අවසාන වුවද උපදේශන සේවා නිම කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිම කර නොතිබූ එම කාර්යයන් සඳහා ප්‍රමාද ගාස්තු (Liquidity Damages**)** අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | උපදේශන සේවා හතර නිශ්චිතව දක්වා නොමැති බැවින් ඒ පිළිබඳව අදහස් දැක්විය නොහැක. | ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහායවීමේ ව්‍යාපෘතියේ නැවත සංවර්ධනය කිරිමට යෝජිත අක්කර 111.5 බිම් කොටස් එකොලහකි. සමස්ථ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ සැලැස්මට අනුව ඉහත සඳහන් ඉඩම් කට්ටි 11 න් ඉඩම් කට්ටි 04 ක් 2020 වර්ෂය තුලදී සංවර්ධනය කිරිමට නියමිත අක්කර 37.5 ක ප්‍රමාණයකි. කෙසේවෙතත් එය 2021 මැයි මස අවසාන වන විටත් නිමකර නොමැත. නිදහස් කිරීමට පෙර ඉඩමේ යෝජිත නැවත පදිංචි කිරිමේ නිවාස හිමියන් හඳුනාගෙන 2020 වන විට අවසන් කිරිමට අවශය සැලසුම් සකස්කල යුතුව තිබුණි. කෙසේ වෙතත් මෙය 2021 ජුනි 10 වන දින දක්වාත් සිදුකර නොතිබුණි. | තෝරාගත් ඉඩම් 10 න් 3 ක් සංවර්ධනය කිරීම සඳහා දැනට ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතී. සංවර්ධනය සඳහා යොමු කොන්දේසි සකස් කර AIIB වෙත ඉදිරිපත් ඇත. **PPP** ආකෘතිය යටතේ ඉඩම් සංවර්ධනය කිරිමට අපේක්ෂා කෙරේ. තවද ඉඩම්වල පදිංචි කිරීම**,** හිස් ඉඩම් සංවර්ධන කටයුතු සඳහා පමණක් නොව හිස් රජයේ ඉඩම් භාවිතා කිරිමේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සඳහාද ඉඩම් සංවර්ධනය සඳහා AIIB වෙත යෝජනා ඉදිරිපත් කර ඇත. | සැලසුම් අනුව ඉඩම් සංවර්ධන කටයුතු අවසන් කළ යුතුය. |

## 3.7 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය | | |
| **(i)** සමාලෝචිත වර්ෂය අවසාන වන විට උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට අපොහොසත් වීම මත ලෝක බැංකුව ලබාදීමට එකඟ වූ එ.ජ.ඩො. මිලියන 202 ක ණය මුදලින් මිලියන 92 ක් අවලංගු කර තිබුණි. මේ හේතුවෙන් ව්‍යාපෘතිය යටතේ අපේක්ෂා කරන ලද ප්‍රතිලාභ ළඟා කර ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | මහනුවර බහුකාර්ය ප්‍රවාහන පර්යන්තය (KMTT) සම්පූර්ණ කිරීමට කාලය නොමැතිකම හේතුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 202 න් US$ 65 ක් ලබාගෙන ඇත. කෙසේ වෙතත් KMTT නව ව්‍යාපෘතියක් ලෙස 2021 සිට ක්‍රියාත්මක කෙරේ. | ගිවිසුම ප්‍රකාරව සැලසුම් කල පරිදි අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට කලමනාකරණය කටයුතු කල යුතුය. |
| **(ii)** ව්‍යාපෘතිය සඳහා ණය සපයනු ලබන ලෝක බැංකුව විසින් වෙන්කරන ලද රු.මිලියන 27,507 කට සමාන එජඩො මිලියන 202 ක මුළු අරමුදල්වලින්**,** ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ දින සිට වර්ෂ 6 ½ ක් ඉකුත් වූ පසු එනම් 2020 දෙසැම්බර් 31 දිනට මුළු වෙන්කිරීමෙන් සියයට 36 ක් නියෝජනය වන රු.මිලියන 11,645.64 කට සමාන එජඩො මිලියන 72.61 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | අදහස් දැක්වීමට එකඟ නැත. ඇමරිකානු ඩොලර් මිලියන 147.0 සඳහා මුල් මූල්‍ය ආරම්භක දිනය 2014 ජූලි 1 වන අතර අතිරේක මූල්‍ය ඇමරිකානු ඩොලර් මිලියන 55 2016 ඔක්තෝම්බර් 19 සිට ක්‍රියාත්මක වේ. ව්‍යාපෘතියේ භෞතික කාර්ය සාධනය ක්‍රියාත්මක කිරීමේ ඉලක්කයට නොපැමිණීම හේතුවෙන් අරමුදල් වෙන් කිරීම අඩු වීමට හේතු විය. | ඌන භෞතික හා මූල්‍ය කාර්යසාධනයට හේතු සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | | |
| (i) ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනයෙන් **(AFD)** රු. මිලියන 204.25 කට සමාන යුරෝ මිලියන 1.27 ලබාගෙන තිබුණු අතර 2019 වර්ෂයේදි හා සමාලෝචිත වර්ෂය තුළ කිසිදු අත්තිකාරම් මුදලක් | අදහස් දැක්වීමට එකඟ විය. කෙසේ වෙතත්**,** ව්‍යාපෘතිය 2020 මූල්‍ය වර්ෂය අවසන් වන විට AFD වෙතින් ලබාගත් මූලික අත්තිකාරමෙන් (රු. 204.25) 87%ක් භාවිතා | අරමුදල් ඌණ උපයෝජනයට හේතු සොයා බලා ව්‍යාපෘතිය ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය තුල නිම කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබාගෙන නොතිබුණි. තවද ලබාගත් අත්තිකාරම් මුදලින් ඉකුත් වර්ෂය අවසානයට ඉතිරිව පැවති රු. මිලියන 94.37 කට සමාන යුරෝ මිලියන 0.58 කින් රු. මිලියන 26.50 කට සමාන යුරෝ මිලියන 0.17 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් උපයෝජනය නොකර ඉතිරිව පැවතුණි. | කර ඇති අතර 2021 මැයි වන විට, 2 වැනි පුනර්ජනනීය අත්තිකාරම් ලබා දී ඇත. | |
| (ii) | වටිනාකම රු. මිලියන 336.25 ක් වූ උප කොන්ත්‍රාත් 4 ක් අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය විසින් 2020 ජූලි කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රදානය කර තිබුණු අතර එම ව්‍යාපෘති 2021 ජූලි අවසන් වීමට නියමිතව තිබුණි. නමුත් 2021 මාර්තු වන විට එම උප ව්‍යාපෘති 03 ක භෞතික ප්‍රගතිය සියයට 10 ත් 30ත් අතර පහළ අගයක පැවතුණි. කොන්ත්‍රාත් කරුවන්ට ලබාදුන් සැලැසුම් සහ ප්‍රමාණ පත්‍රවල ප්‍රමාණවත් වැරදි තිබීම මෙම තත්ත්වයට සෘජුව හේතු වී තිබුණි. මෙම සැලැසුම් අඩුපාඩු හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් අමතර පිරිවැය ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබුණි. එබැවින් ඉදිකිරීම් කටයුතු වලට අදාළ සත්‍ය පිරිවැය ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා යා හැකි බව වැඩි දුරටත් නිරීක්ෂණය විය. | අදහසට එකඟයි. DDS උපදේශකගේ සහාය ඇතිව UDA ගෘහ නිර්මාණ ශිල්පියා විසින් PIU තාක්ෂණික කාර්ය මණ්ඩලය සමඟ මෙම ගැටළු නිරාකරණය කරන ලදී. | සැලැසුම් සහ ප්‍රමාණ පත්‍ර සැකසූ සහ අධීක්ෂනය කල සහ අනුමැතිය ලබාදුන් අයගෙන් අමතර පිරිවැය අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (iii) | ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් වෙන් කරන ලද රු. මිලියන 8,354.22 කට සමාන යුරෝ මිලියන 52 ක මුළු අරමුදල් වලින්, අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ දින සිට වර්ෂ 4 ක් ඉකුත් වූ පසු එනම් 2020 දෙසැම්බර් 31 දිනට මුළු වෙන් කිරීමෙන් සියයට 3 ක් නියෝජනය වන රු. මිලියන 308.84 කට සමාන යුරෝ මිලියන 1.84 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | අදහස් දැක්වීමට එකඟ විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය 2020 මූල්‍ය වර්ෂය අවසන් වන විට AFD වෙතින් ලබාගත් මූලික අත්තිකාරමෙන් (රු. 204.25) 87%ක් භාවිතා කර ඇති අතර 2021 මැයි වන විට, 2 වැනි පුනර්ජනනීය අත්තිකාරම් ලබා දී ඇත. | අරමුදල් ඌණ උපයෝජනයට හේතු සොයා බලා ව්‍යාපෘතිය ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය තුල නිම කිරීමට කටයුතු කල යුතුය. |

## 3.8 වෙනත් නිරීක්ෂණ

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී තිරසාර නගර සංවර්ධන ව්‍යාපෘතිය සහ අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් අයවැය ඇස්තමේන්තු මගින් වෙන්කරන ලද ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු. මිලියන 50 ක් සහ රු.මිලියන 35ක් වශයෙන් එකතුව රු.මිලියන 85 ක් මු.රෙ. 66 යටතේ උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් යොදාගෙන තිබුණි. | එකඟ විය. අවශ්‍ය අමතර අරමුදල් ප්‍රතිපාදන හේතුවෙන් අප විසින් ඌන ප්‍රයෝජනයට ගෙන ඇති AIUDP සහ නාගරික ව්‍යාපෘති සූදානම් කිරීමේ පහසුකම් ව්‍යාපෘති අරමුදල් භාවිතා කර ඇත. | තිරසාර නගර සංවර්ධන ව්‍යාපෘතිය සහ අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතියේ ඌණ කාර්යසාධනයට හේතු සොයාබලා පිළියම් යෙදිය යුතුය. |

## 3.9 පාඩු හා හානි

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 මැයි වන විට උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය ප්‍රතිපූර්ණය කරන ලද මුදල එ.ජ.ඩො. මිලියන 80.55 ක් වූ අතර සංශෝධිත ණය ගිවිසුම අනුව 2021 දෙසැම්බර් 31 දිනට තවදුරටත් ලබා ගත හැකි ණය මුදල එ.ජ.ඩො. මිලියන 26.71 ක් විය. නමුත් ව්‍යාපෘති කටයුතු අවසාන වන විට තවදුරටත් අවසන් නොවූ කොන්ත්‍රාත් වෙනුවෙන් ව්‍යාපෘතියට ගෙවීමට සිදුවන මුදල එ.ජ.ඩො. මිලියන 31.39 ක් පමණ වන බව විගණනයේදි නිරීක්ෂණය විය. මේ හේතුවෙන් ආසන්න වශයෙන් එ.ජ.ඩො. මිලියන 4.68 ක් ශ්‍රී ලංකා රජයට අමතර වැය බරක් ලෙස දැරීමට සිදුවන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | පවතින කොන්ත්‍රාත්තුවලින් විය හැකි ඉතිරිකිරීම් සහ රුපියල් වලින් අපේක්ෂිත අවප්‍රමාණය සලකා බලා ලෝක බැංකුව විසින් මෙම ගැලපීම සිදු කර ඇත. එබැවින් කැපවී ඇති සියලුම උප ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් මුදල් අප සතුව ඇත. | අනුමත මුදල් සීමා තුල කටයුතු කල යුතුය. |
| (ආ) නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහායවීමේ ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට යෝජිත වූ නිවාස 1000 කින් සමන්විත ස්ටේඩියම් ගම නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් සමාගම විසින් කරන ඉල්ලීමට අනුව අත්තිකාරම් ලෙස රු.මි.595 ක් ගෙවා තිබුණි. එම වටිනාකමින් 60% ක් එනම් රු.357,057,000 ක් රුපියල් වලින් හා ඉතිරි 40% ක් වන රුපියල් 238,038,000 ක වටිනාකමට ඇති කරගත් | කොන්ත්‍රාත්කරු සමඟ ඇතිකරගත් ගිවිසුමට අනුකූලව ගෙවීම් කර ඇත. | කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු වටිනාකම අනුව ටෙන්ඩර් කැඳවා එකඟ වී ගිවිසුම්ගතව ලබාදුන් කොන්ත්‍රාත් වටිනාකම හා |

| | | |
|---|---|---|
| ගිවිසුම් ප්‍රකාරව 2019 අගෝස්තු 27 දිනට විනිමය අනුපාත රේටය වන රු.176.00 ක ස්ථිර අගයක් මත ඇමෙරිකානු ඩොලර් 1,352,488.64 ක වටිනාකමට පරිවර්ථනය කර විදේශ ණය යටතේ මහ බැංකුවේ ඩොලර් ගිණුමෙන් එදින රේටයට රු.250,475,486 ක් වන ලෙස ගෙවීම් කර තිබුණි. මෙසේ රුපියල් වටිනාකම ස්ථිර අගයක් මත ඩොලර් වලට පරිවර්තනය කර නැවත වර්තමාන ඩොලර් අගය ගෙවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට රු. 12,437,486 ක් වැඩිපුර ගෙවීමක් අත්තිකාරම් ගෙවීමේදීම සිදු වී තිබුණි. | | ඇස්තමේන්තු වටිනාකමද ඉක්මවා ගෙවීමක් හා රජයට පාඩුවක් සිදුවන බැවින් එසේ සිදු නොවන ලෙස හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව ගිවිසුමවලට එළඹිය යුතුය. |

**4. යහපාලනය**
---------------

**4.1 අභ්‍යන්තර විගණනය**
------------------------

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2016 ජුනි 10 දිනැති මුදල් රෙගුලාසි 134 (3), හා කළමනාකරණ විගණන චක්‍ර ලේඛන අංක 02/2016 අනුව අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ආරම්භක දින සිට 2020 දෙසැම්බර් 31 දක්වාම ව්‍යාපෘතිය මඟින් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත | අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |